# ලංසු ආරාධනාවයි

# දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - රත්නපුර

රාජ්‍ය පරිපාලන පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යංශය වෙනුවෙන් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති ලෙස රත්නපුර දිස්ත්‍රික් ලේකම් විසින් පහත සඳහන් ව්‍යාපෘතිය සඳහා සුදුසුකම්ලත් ලංසුකරුවන්ගෙන් මුද්‍රා තබන ලද ලංසු කැඳවනු ලැබේ.

| අනු අංකය | වැඩ විෂය | ව්‍යාපෘතිය පිහිටි ස්ථානය | ඇස්තමේන්තු ගත වැඩ වටිනාකම (රු.මි.) | ආපසු ගෙවන ලංසු ඇපකරය (රු.) | ආපසු නොගෙවන ලංසු ලියකිවිලි ගාස්තුව (රු.) | කොන්ත්‍රාත් කාලය | ලංසු ඇපකරයේ වලංගු කාලය | CIDA, ලියාපදිංචි ශ්‍රේණිය |
|---|---|---|---|---|---|---|---|---|
| 1 | කළුවෙල පාර මැද පාලම අලුත්වැඩියා කිරිම | ඇහැලියගොඩ | 9.61 | 100,000.00 | 2,500.00 | මාස 03 | දින 77+28 | C8/C7/C6 Highway/ Bridge |
| 2 | තෙප්පනාව ඉහළගම හා මැදගම වසම් යාකරන ඉහලවෙල (හල්දොළ) පාලම ඉදිකිරිම | කුරුවිට | 7.49 | 76,000.00 | 2,500.00 | මාස 03 | දින 77+28 | C8/C7/C6 Highway/ Bridge |
| 3 | ඇතා නාවපු වල ගාලබැදිහේන කැටවල යා කරන පාලම ප්‍රතිසංස්කරණය කිරිම | රත්නපුර | 9.02 | 100,000.00 | 2,500.00 | මාස 03 | දින 77+28 | C8/C7/C6 Highway/ Bridge |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| 4 | හල්දොල රජු සිසුගමටපිවිසෙන මාර්ගයේ බෝක්කුව පාලමක් ලෙස සංවර්ධනය කිරීම | ඇලපාත | 5.10 | 60,000.00 | 2,500.00 | මාස 03 | දින 77+28 | C8/C7/ Highway/ Bridge |
| 5 | මුදුන්මංකඩ හා පවුල් නිවාස මාර්ගය යා වන කොකිස් අච්චු පාලම ප්‍රතිසංස්කරණය කිරීම | ඇඹිලිපිටිය | 8.82 | 90,000.00 | 2,500.00 | මාස 03 | දින 77+28 | C8/C7/C6 Highway/ Bridge |
| 6 | හල්ලින්න තේ කර්මාන්ත ශාලාව අසල සිට තැන්න ගමට ප්‍රවේශ වන ස්ථානය දක්වා ඇති මාර්ගයේ නාවින්න පාලම සංවර්ධනය කිරීම (හුණුවල - පොල්වත්ත මාර්ගයේ කිලෝමීටර් 0.5ක දුරින් පිහිටි) | ඕපනායක | 20.66 | 248,000.00 | 6,000.00 | මාස 03 | දින 77+28 | C6/C5/C4 Highway/ Bridge |
| 7 | හටංගල, පළුගහ වෙල, බඹරගල වසම් යා කරන කපල්ලහෙල කෘෂි මාර්ගය හටංගල සිට බඹරගල දක්වා සංවර්ධනය කිරීම. | වැලිගෙපොල, හටංගල | 9.52 | 115,000.00 | 3,500.00 | මාස 03 | දින 77+28 | C8/C7/C6 (මාර්ග) |
| 8 | මඩුවන්වෙල ළමා උද්‍යානයක් හා අලෙවි කුටි ඉදිකිරීමේ ව්‍යාපෘතිය | කොලොන්න, මඩුවන්වෙල | 17.08 | 175,000.00 | 5,000.00 | මාස 03 | දින 77+28 | C7/C6/C (ගොඩනැගිලි) |

1. මෙම ව්‍යාපෘතිය ජාතික තරඟකාරී ලංසු ක්‍රමය යටතේ ලංසු කැඳවීම සිදු කරනු ලබන අතර, කොන්ත්‍රාත් ප්‍රදානය සඳහා ලියාපදිංචිය අසාධු ලේඛණගත නොවිය යුතුය.

2. ලංසුපත් නිකුත් කිරීම 2026. 08. 10 දින සිට 2026. 08. 24 දින දක්වා රාජකාරී දිනයන්හි පෙ. ව 9.00 සිට ප.ව 3.00 දක්වා රත්නපුර, නව නගරයේ දිස්ත්‍රික් ලේකම් කාර්යාල පරිශ්‍රයේ සැලසුම් අංශයේදී සිදු කෙරේ. ලංසුපත් නිකුත් කරන කාලය තුළ රාජකාරී දිනයන්හි පෙ.ව 9.00 සිට ප.ව 3.00 දක්වා කාලය තුළ ගාස්තු ගෙවීමකින් තොරව ලංසුපත් පරීක්ෂා කළ හැකිය.

3. දිස්ත්‍රික් ලේකම් රත්නපුර නමින් ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කිරීමෙන් හා ආපසු නොගෙවන ඉහත සඳහන් ලංසු ගාස්තුව සඳහා රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පිහිටි ලංකා බැංකු ශාඛාවෙන් දිස්ත්‍රික් ලේකම් , රත්නපුර යන නාමයට ගෙවා ලබා ගත් රිසිට් පත ඉදිරිපත් කිරීමෙන් ලංසු පත් ලබා ගත හැකිය.

4. සුදුසුකම් ලත් ලංසුකරු තම ලංසු ඉදිරිපත් කරන අවස්ථාවේදී ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ (CIDA) ලියාපදිංචිය ඇති කොන්ත්‍රාත්කරුවෙකු විය යුතුය.

5. ඉහත ව්‍යාපෘතිය සඳහා ලංසුපත් සමඟ ලංසු ඇපකරයක් ඉදිරිපත් කළ යුතු අතර, එම ලංසු ඇපකරය කොන්දේසි රහිත (unconditional on Demand bond) ශ්‍රී ලංකා මහ බැංකුවේ ලියාපදිංචි වාණිජ බැංකුවකින් දිස්ත්‍රික් ලේකම් රත්නපුර නමින් ලබාගත් බැංකු ඇපකරයක් ලෙස ඉදිරිපත් කළ යුතුය. එසේ නොමැති නම් ඉහත ලංසු ඇපකර ගාස්තුව රත්නපුර දිස්ත්‍රික් ලේකම් නමින් තැන්පත් කළ යුතුවේ. වලංගු ලංසු ඇපකරයක් සමඟ හෝ රත්නපුර දිස්ත්‍රික් ලේකම් නමින් මුදල් තැන්පත් කළ කුවිතාන්සිය සමඟ ඉදිරිපත් නොකරන ඕනෑම ලංසු පතක් ප්‍රතික්ෂේප කරනු ලැබේ. වැඩ විෂයට අදාළ ලංසු ඇපකරයේ වටිනාකම ඉහත දක්වා ඇත.

6. ලංසුපතෙහි මුල් පිටපත හා අනු පිටපත ලෙස පැහැදිලිව සඳහන් කර කවර දෙකක වෙන වෙනම බහා මුද්‍රා තැබිය යුතු අතර එම කවර දෙක නැවත එක් කවරයකට දමා මුද්‍රා තබා එම කවරයේ වම්පස ඉහල, ලංසු ඉදිරිපත්කරන ව්‍යාපෘතියේ නම පැහැදිලිව සඳහන් කර සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, රත්නපුර නමට ලියා 2026. 08. 25 දින ප.ව. 2.00 ට හෝ ඊට පෙර ලැබෙන සේ ඉදිරිපත් කළ යුතුය. මෙය ලියාපදිංචි තැපැල මගින් එවීම හෝ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ගිණුම් අංශයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීම මගින් කළ හැකිය.

7. ලංසුපත් භාරගැනීම අවසන් වූ විගස (2026. 08. 25 දින ප.ව. 2.00න් පසුව) ලැබී ඇති ලංසුපත් විවෘත කිරීම සිදුකරනු ලබන අතර ලංසුකරුවන්ට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයෙකුට මෙම අවස්ථාව සඳහා සහභාගී විය හැකිය.

8. ප්‍රමා වී ලැබෙන ලංසුපත් පිළිනොගන්නා අතර ඒවා විවෘත නොකර අදාළ ලංසුකරුට නැවත භාරදෙනු ලැබේ.

9. පූර්ව ලංසු රැස්වීම 2026 අගෝස්තු 18 වන දින පෙ.ව.11.00 ට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සැලසුම් අංශයේදී පැවැත්වේ.

10. මේ සම්බන්ධයෙන් වැඩිමනත් තොරතුරු දුරකථන අංකය 045-2222870 හා විද්‍යුත් තැපැල **dpsratnapura@gmail.com** මගින් අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන), දිස්ත්‍රික් ක්‍රමසම්පාදන ලේකම් කාර්යාලය, දිස්ත්‍රික් ලේකම් කාර්යාල සංකීර්ණය, නව නගරය, රත්නපුර වෙතින් ලබාගත හැකිය.

එම්.පී. ලලිත් ආනන්ද
දිස්ත්‍රික් ලේකම්/දිසාපති
රත්නපුර.

සභාපති

දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

නව නගරය, රත්නපුර.

o/c
08/07